# මහනුවර බලා ගිය ජේ.ආර්ගේ පා ගමන හා රනිල්ගේ රිය ගමන



කොළඹ සිට කතරගමට හෝ වේවා මහනුවරට හෝ වේවා පා ගමන්, රිය පෙරහැර පැවැත්වෙන සෑම අවස්ථාවකම මගේ මතකය අඩසියවසකිනුත් ඔබ්බට පිවිසෙයි.

පසුගිය සතියේ අලුතින් පිහිටුවන ලද එක්සත් ජාතික පෙරමුණ රිය පෙරහරකින් මහනුවර බලා ගියේය.

ඒ පෙරහරට හොරගොල්ල බණ්ඩාරනායක සමාධිය අසලදී විරෝධතාවක් මතු වූ බව වාර්තා විය. ඒ අවස්ථාවේදී මට සිහිපත් වූයේ ඊට පනස් දෙවසරකට පෙර කොළඹ සිට මහනුවර දක්වා එජාපය සංවිධානය කළ පා ගමනයි. මේ පා ගමන පවත්වන ලද්දේ ජාතික සමගිය තහවුරු කිරීම සඳහා අගමැති එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක සහ තමිල් අරසුකච්චි නායක ඇස්. ජේ.වී. චෙල්වනායගම් යන දෙපොළ රොස්මීඩ් පෙදෙසෙහි දෛවෝපගත නිවසේදී අත්සන් කරන ලද බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුමට විරුද්ධවය.

එදා මේ නායක දෙපොළ ප්‍රධාන දේශපාලන පක්ෂවල සර්වබලධාරී නායකයන් වී සිටියහ. අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් වූ මහජන එක්සත් පෙරමුණට පාර්ලිමේන්තුවේ ආසනවලින් 57 ක්ම හිමිව තිබුණි. ෆෙඩරල් පක්ෂයටද උතුරු නැගෙනහිරින් මන්ත්‍රීවරු 10 දෙනෙකු අයත් වූහ. එක්සත් ජාතික පක්ෂයට එවකට හිමිව තිබුණේ ආසන 8 කටත් අඩු ගණනකි.

***මේ පා ගමනට එරෙහිව ක්‍රියාත්මක වූ ජනතා විරෝධය කිසිසේත්ම රජයෙන් හෝ වෙනත් බලවේගයකින් හෝ මෙහෙයවන ලද්දක් නොවීය. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පනස් ගණනින් මේ විරෝධයට එක් වූයේ අද්‍යත් අප අතර සිටින ගම්පහ මන්ත්‍රී ඇස්.ඩී. බණ්ඩාරනායක මහතා පමණී. මේ විරෝධය හුදෙක් ජනතාව ක්ෂණිකව හැඟීම්බරව නැගී ආ එකක් පමණී. පා ගමන අසාර්ථක වුවද ජයවර්ධන මහතා අරගලය අත් හැරියේ නැත. බණ්ඩාරනායක චරිතයේ ප්‍රබල තැන් සහ දුබල තැන් ද හොඳින් දැන සිටි ජයවර්ධන මහතාගේ දෙවැනි පියවර වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේ ලවා විරෝධයක් පැවැත්වීමය.***

ජේ.ආර් ජයවර්ධන මහතා විසින් සංවිධානය කරන ලද පා ගමනට එම මන්ත්‍රීන් අතුරින් එකතු වූයේ මතුරට මන්ත්‍රී ඇම්.ඩී. බණ්ඩා මහතා පමණී.

ඩඩ්ලි සේනානායක මහතා ඇතුළු නායක පිරිසක් පෙරහර ආරම්භ වූ අවස්ථාවේ සිට තොටළඟ දක්වා පමණක් ගොස් පෙරළා කුරුඳුවත්තට ගියේ මෝටර් රථයකිනි.

වික්ටෝරියා පාලම අසල සිට බලවත් විරෝධතා මධ්‍යයේ පා ගමන්කරුවෝ අඳුරු වැටෙන විට කඩවතට ළඟා වූහ. කවුරුත් පයින් ගමන් කළ නමුත් භික්ෂූන් වහන්සේ කිහිප නමක් වැඩම කළේ ට්‍රක් රථයක සවිකරන ලද පිරිත් මණ්ඩපයක අසුන්ගෙනය. උන්වහන්සේ පිරිස දිගටම පිරිත් සජ්ඣායනය කළහ.

කඩවත සිට බලවත් විරෝධතා මධ්‍යයේ පා ගමන ඉඹුල්ගොඩට ළඟා වනවිට ගමනේ යන පිරිස 150කටත් අඩු වූහ. ඉඹුල්ගොඩ කන්ද කැපූ තැන ජේ.ආර් ජයවර්ධන මහතාගේ දේශපාලන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි.

1943 කැලණිය අතුරු මැතිවරණයට ඉදිරිපත් වූ අවස්ථාවේ ජයවර්ධන මහතාගේ ප්‍රධාන මැතිවරණ කාර්යාලය පිහිටා තිබුණේ එහි පිහිටි විශාල බංගලාවකය.

ඉඹුල්ගොඩදී සිදුවූ විරෝධතාව නිසා පා ගමන අත්හිටුවීමට ජයවර්ධන මහතාට සිදුවිය. පිරිත් මණ්ඩපයේ සිටි භික්ෂූන් වහන්සේ දහනමක් අතුරින් කඩවත පසුකොට ගියේ දෙනමක් පමණී. පා ගමන්කරුවෝ ද ඉතිරි වී සිටියේ අතලොස්සකි.

මේ පා ගමනට එරෙහිව ක්‍රියාත්මක වූ ජනතා විරෝධය කිසිසේත්ම රජයෙන් හෝ වෙනත් බලවේගයකින් හෝ මෙහෙයවන ලද්දක් නොවීය. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පනස් ගණනින් මේ විරෝධයට එක් වූයේ අද්‍යත් අප අතර සිටින ගම්පහ මන්ත්‍රී ඇස්.ඩී. බණ්ඩාරනායක මහතා පමණී. මේ විරෝධය හුදෙක් ජනතාව ක්ෂණිකව හැඟීම්බරව නැගී ආ එකක් පමණී.

පා ගමන අසාර්ථක වුවද ජයවර්ධන මහතා අරගලය අත් හැරියේ නැත. බණ්ඩාරනායක චරිතයේ ප්‍රබල තැන් සහ දුබල තැන් ද හොඳින් දැන සිටි ජයවර්ධන මහතාගේ දෙවැනි පියවර වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේ ලවා විරෝධයක් පැවැත්වීමය.

ඒ විරෝධය සඳහා ජනතාව අතර අප්‍රසාදයට ලක් නොවූ ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ කිහිප නමක් තෝරා ගැනීමේ කාර්යය පැවරුණේ ඇම්. ඩී.බණ්ඩා, ඊ.එල්.බී.හුරුල්ලේ යන මන්ත්‍රීවරුන්ටය. ප්‍රයත්නය සාර්ථක විය. දහසකට අධික භික්ෂූන් වහන්සේ රොස්මීඩ් පෙදෙසට රැස් වී සත්‍යග්‍රහයක් ඇරැඹුවේ ගිවිසුම වහාම ඉරා දමන ලෙස අගමැතිවරයාට බල කරමිනි.

බණ්ඩාරනායක මහතා එදා ගිවිසුම පුළුස්සා දමන අවස්ථාවේ කළ ප්‍රකාශය මසුරන් වටිනා බව ඉන්පසු වූ සිද්ධීන් දෙස බලන විට මොනවට පැහැදිලි වේ.

අගමැතිවරයා පැවසූ වදන් මෙසේය.

“ඔබ වහන්සේ කියනවා ගිවිසුම අවලංගු කරන්න කියලා. මම ඔබ වහන්සේලාට කියනවා මේ ගිවිසුම දැන් පුළුස්සා දමනවා කියලා. හැබැයි පිලාත් කියාපු කියමන ඔබ වහන්සේ දන්නවා ඇති. ක්‍රිස්තුස් වහන්සේ මරණ දණ්ඩනයට නියම කරමින් පිලාත් නැමැති ආණ්ඩුකාරයා කීවේ මේ මනුස්සයගෙ ලේවලට මං අපරාධකාරයෙක් නෙමෙයි කියලා අත්සෝදා ගන්නවා” කියාය. එසේම මේ ගිවිසුම අවලංගු කිරීමෙන් ඇතිවන අනිෂ්ට ප්‍රතිඵලවලට මා වරදකරුවකු නොවන බව පැහැදිලිව කියනවා.

එදා පටන් අනිෂ්ට ප්‍රතිඵල මනාවට දකින්නට ලැබුණි. එදා බණ්ඩාරනායක මහතා නියපොත්තෙන් කඩා දැමීමට සැරසුණු ජාතිවාදයේ පැළෑටිය අවුරුදු 50ක් තිස්සේ කෙතරම් විශාල වීද යත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට එය කපා දැමීම සඳහා පොරෝ දහසක් පමණ නොව නවීන යන්ත්‍ර සූත්‍ර ද උපයෝගී කර ගැනීමට සිදුවිය.

පසුගියදා පැවැති රිය පෙරහරේද එදා පා ගමන හා සසඳන විට සමානකම් බොහෝමයක් ඇති බව පෙනේ. අලුතින් පිහිටුවන ලද එක්සත් ජාතික පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මල්වත්ත සහ අස්ගිරියේ මහ නායක හිමිවරුන් අතට පුද කරන ලද බව මාධ්‍ය මගින් දැන ගත්තෙමු.

උන්වහන්සේ අතින් හුදී ජනතාවට මේ ප්‍රකාශනයේ අඩංගු කරුණු මේ ලිපිය ලියන විටද ලැබී ඇත්තේ ස්වල්පයකි. ඒ නිසා අලුතින් පිහිටුවන ලද මේ යෝධ ජාතික පෙරමුණේ ප්‍රධාන නායකයන් දෙපොළ වන රනිල් වික්‍රමසිංහ හා මංගල සමරවීර යන මහත්වරුන් කරන ලද ප්‍රකාශ තෝරා බේරා පෙරා ගත් විට අපට ඉතිරිවන්නේ පතඅට එකට හිඳුවූ කසාය නොව ඉවත දමන්නට වන අරළු - බුළු - පත්පාඩගම් ආදී රොඩු ටික පමණී.

මේ දක්වා මේ දෙපොළගේ ප්‍රකාශ අනුව ප්‍රතිපත්ති මාලාව අපට හැඟෙන අන්දමින් පෙනෙන්නේ මෙසේය.

1. මහින්ද රාජපක්ෂගේ පාලනය අවසන් කළ යුතුය.

2. රාජපක්ෂ පවුල රටින් පිටුවහල් කොට ඇමෙරිකාව හෝ වෙනත් රටකට හෝ යැවිය යුතුය.

3. රජයේ සිටින මන්ත්‍රීවරුන් හැකි තරමක් 1964 කළ අන්දමින් බිලී බා ගත යුතුය.

4. දෙමළ ජාතික සංධානය හා ජනතා විමුක්ති පෙරමුණ අපේ ගොඩට කෙසේ හෝ එක්කර ගත යුතුය.

5. අවසාන වශයෙන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට රනිල් වික්‍රමසිංහ මහතා විධායක අගමැති පදවියට පත් කර ගත යුතුය.

මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ජනතාවගේ ඡන්දය අවශ්‍ය ද නැද්ද යන්න වටහා ගත හැක්කේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවීමෙන් පමණී.

කඩිමුඩියේ නිකුත් කෙරෙන අටවාගත් ප්‍රතිපත්ති ප්‍රකාශනවලට ජනතාවගේ ඡන්දය ලබා ගත් කාලය දැන් ඉක්මගොස් ඇත.

මල්වත්ත මහ නා හිමියන් “බොරු පොරොන්දු දෙන්න එපා” යැයි රනිල් වික්‍රමසිංහ මහතාට පැවසූ බව වාර්තා වේ. උන්වහන්සේ මෙසේ පැවසූයේ යථාර්ථය තේරුම් ගැනීමෙන් බව පැහැදිලිය. තවද උන්වහන්සේ විධායක ජනාධිපති ක්‍රමය ගැන පමණක් නොව සමානුපාතික ඡන්ද ක්‍රමය හා තවත් කරුණු කිහිපයක් ගැන අදහස් පළකළ බවද වාර්තා වේ.

එකී, නොකී සියල්ල 1977 එජාප ජයවර්ධන

8 වන පිටුවට



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
එස්. පියසේන

**AusLanka Study Center™**
**Education Agents**

**Free** Consultation for Sri Lankan Students
- Want to change Education Provider and Course?
- Need Cancellation Letter or Released Letter?
- Have you completed your Diploma and want to do your Degree?
- Don't pay high course fee.

**Talk to leading education agents for**
- Change of education provider
- Uni/Tafe placement
- Any University or Tafe College
- Visa sub class 572 to 573
- Visa sub class 573 to 572
- Extend Student Visa
- New Student Visa
- Sponsor your Relatives for Student Visa

**Call NOW!**

Mobile: **0433 023 687**
Skype : **auslanka-center**
**www.auslanka.edu.lk** (*Call, SMS or email*)
**eranl@auslanka.edu.lk**

ABN 50758298781
Scholarships are available for limited Numbers of Students *
*Condition apply

**Colombo • Galle • Kandy • Matara • Melbourne**